Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned by TapScanner

**B කොටස - රචනා**

**ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් ලැබේ.)**

05. (a) (i) පරිපූර්ණ ලෙස නොහැසිරෙන වායුවක් සඳහා උචිත වන සේ PV = nRT යන සමීකරණය වෙනස් කර ඇති ආකාරය පැහැදිලි කරන්න.
මෙම වෙනස් කිරීමෙන් පසු ලැබෙන වැන්ඩවාල්ස් සමීකරණය පැහැදිලි ව ලියන්න.

(ii) පරිමාව 7.76 $dm^3$ වන සංවෘත භාජනයක් තුළ හීලියම් සහ ඔක්සිජන් යන මේවායේ මිශ්‍රණයක් ඇත. 280 K දී භාජනය තුළ පීඩනය $1.50 \times 10^5$ N $m^{-2}$ විය. භාජනය තුළ විද්‍යුත් ක්‍රමයකින් ගිනි දැල්විය හැකි මැග්නීසියම් පටියක් ඇති අතර මෙම මැග්නීසියම් පටිය ගිනි දැල් වූ විට ඔක්සිජන් සම්පූර්ණයෙන්ම රසායනිකව මැග්නීසියම් සමග සංයෝජනය විය. ප්‍රතික්‍රියාවෙන් පසු 327.5 K දී භාජනය තුළ පීඩනය $0.702 \times 10^5$ N $m^{-2}$ විය.

I. මැග්නීසියම් සහ මැග්නීසියම් ඔක්සයිඩ හි සමස්ත පරිමාව නොගිනිය හැකි වේ යයි උපකල්පනය කරමින් භාජනය තුළ තිබෙන හීලියම්වල ස්කන්ධය ගණනය කරන්න.

II. භාජනය තුළ සෑදෙන මැග්නීසියම් ඔක්සයිඩ හි ස්කන්ධය ගණනය කරන්න. භාජනයේ පරිමාව නියතව පවතී යයි ද, වායුන් පරිපූර්ණ ලෙස හැසිරේ යැයි ද උපකල්පනය කරන්න.

(He = 4, O = 16, Mg = 24)

(i) P පරිපූර්ණ = P' + අන්තර් අණුක ආකර්ෂණය නිසා අඩුවූ පීඩනය **10**

V පරිපූර්ණ = V' − අණු ඝන ගෝල ලෙස ක්‍රියාකිරීම නිසා අසම්පීඩ්‍ය පරිමාව **10**

හෝ

V' − අණු ලක්ෂ්‍ය ස්කන්ධ නොවන නිසා අත් කර ගන්නා පරිමාව

P' හා V' පිළිවෙළින් සත්‍ය වායුවක පීඩනය හා පරිමාව වේ.

වැන්ඩවාල්ස් සමීකරණය

$$\left(P + \frac{n^2a}{V^2}\right)(V - nb) = nRT$$ **10**

හෝ

මවුල 1 ක් සඳහා

$$\left(P + \frac{a}{V^2}\right)(V - b) = RT$$

a(i) − 30

Scanned by TapScanner

(ii) I.

He හා $O_2$ වල මවුල ගණන පිළිවෙලින් $n_{He}$ හා $n_{O_2}$ ලෙස ගනිමු.

ගිනි දැල්වීමෙන් පසු පද්ධතිය සඳහා පරිපූර්ණ වායු සමීකරණය යෙදීමෙන් ;

$$pV = nRT$$ 02

$$0.702 \times 10^5 \, Nm^{-2} \times 7.76 \times 10^{-3} \, m^3 = n_{He} \times 8.314 \, JK^{-1}mol^{-1} \times 327.5 \, K$$ 04+01

$$n_{He} = 0.2 \, mol$$ 04+01

He ස්කන්ධය $= 0.2 \, mol \times 4 \, g \, mol^{-1}$ 03+01

$= 0.8 \, g$ 03+01

a(ii) I - 20

II.

ගිනි දැල්වීමට පෙර පද්ධතිය සඳහා පරිපූර්ණ වායු සමීකරණය යෙදීමෙන් ;

$$1.5 \times 10^5 \, Nm^{-2} \times 7.76 \times 10^{-3} \, m^3 = (n_{He} + n_{O_2}) \times 8.314 \, JK^{-1}mol^{-1} \times 280 \, K$$ 04+01

$$n_{He} + n_{O_2} = 0.5 \, mol$$

$$n_{O_2} = 0.3 \, mol$$ 05

$$2Mg + O_2 \longrightarrow 2MgO$$ 05

∴ සෑදුනු MgO මවුල ගණන $= 0.3 \, mol \times 2$

$= 0.6 \, mol$ 05

MgO ස්කන්ධය $= 0.6 \, mol \times 40 \, g \, mol^{-1}$ 04+01

$= 24 \, g$ 04+01

a(ii) II - 30

a - 80



Scanned by TapScanner

(b) 10 °C ට ඉහළ උෂ්ණත්වවල දී A නම් වායුමය සංයෝගය, B හා D නම් වායුමය ඵලවලට වියෝජනය වී පහත දැක්වෙන සමීකරණයෙන් නිරූපණය වන සමතුලිතතාවයට එළඹේ.

$$A(g) \rightleftharpoons B(g) + D(g)$$

(i) ඉහත සමතුලිතතාව සඳහා $K_P$ හා $K_C$ සඳහා ප්‍රකාශන ලියා දක්වන්න. මෙම $K_P$ හා $K_C$ අතර සම්බන්ධතාව ව්‍යුත්පන්න කරන්න. ඔබ සිදුකරන උපකල්පන සඳහන් කරන්න. මෙම සම්බන්ධතාවයෙහි අඩංගු පද හඳුන්වා දෙන්න.

(ii) 5 °C ට පහළ උෂ්ණත්වයක දී He(g) හි 6.5 mol සහ A(g) හි 2.0 mol ඇතුළු කිරීමෙන් ප්‍රත්‍යස්ථ බැලූනයක් පුරවන ලදී. මෙම පද්ධතියට 27 °C දී ඉහත සඳහන් සමතුලිතතාවයට එළඹීමට ඉඩ දෙනු ලැබේ. මෙම තත්ත්ව යටතේ දී බැලූනය තුළ මුළු පීඩනය $1 \times 10^5$ Pa වන අතර එහි A(g) 0.5 mol අන්තර්ගත වේ. ඉහත දැක්වෙන සමතුලිතතාවය සඳහා 27 °C දී $K_P$ හා $K_C$ ගණනය කරන්න.
( $K_C$ හි අගය mol $dm^{-3}$ ඒකක වලින් දක්වන්න.)

(iii) ඉන් පසු ඉහත (ii) හි සඳහන් බැලූනයට වාතයෙහි ඉහළ නැගීමට ඉඩ දෙනු ලැබීය. එක්තරා උන්නතාංශයක දී බැලූනය තුළ වායුවෙහි උෂ්ණත්වය 17 °C වූ විට එහි මුළු පීඩනය $4.9 \times 10^4$ Pa බව ද, He(g) හි ආංශික පීඩනය $3.5 \times 10^4$ Pa බව ද සොයා ගනු ලැබිණි. 17 °C දී ඉහත සමතුලිතතාව සඳහා $K_P$ ගණනය කරන්න.

(iv) 27 °C හා 17 °C දී පිළිවෙළින් (ii) හා (iii) හි A(g), B(g) හා D(g) හි සමතුලිත මවුල භාග සලකා බලමින් ඉහත ඉදිරි ප්‍රතික්‍රියාව තාපදායක ද තාපාවශෝෂක ද යන්න නිගමනය කරන්න.

(i) $K_p = \dfrac{P_{B(g)} \cdot P_{D(g)}}{P_{A(g)}}$ 03

$K_c = \dfrac{[B(g)][D(g)]}{[A(g)]}$ 03

$P = CRT$

$\therefore K_p = \dfrac{[B]RT \cdot [D]RT}{[A]RT}$ 02

$= \dfrac{[B][D]}{[A]} RT$

$= K_c \cdot RT$ 04

R - සර්වත්‍ර වායු නියතය 01

T - නිරපේක්ෂ උෂ්ණත්වය 01

උපකල්පනය : වායූන් පරිපූර්ණ ලෙස හැසිරෙන බව 01

b(i) - 15

Scanned by TapScanner

(ii)

| | $A(g)$ ⇌ | $B(g)$ + | $D(g)$ | |
|---|---|---|---|---|
| ආරම්භක මවුල | 2 | 0 | 0 | |
| සමතුලිත මවුල | 0.5 | 1.5 | 1.5 | 02 |

මුළු වායු මවුල ගණන $= n_A + n_B + n_D + n_{He}$

$= (0.5 + 1.5 + 1.5 + 6.5)\ mol$ | 04

$= 10\ mol$ | 02

$x_A = \frac{0.5}{10} = 0.05 \qquad x_B = x_D = \frac{1.5}{10} = 0.15$ | 01×3

$K_p = \frac{(x_B \times P_T)(x_D \times P_T)}{(x_A \times P_T)}$

$= \frac{x_B \times x_D}{x_A} \cdot P_T$ | 02

$= \frac{0.15 \times 0.15}{0.05} \times 1 \times 10^5\ Pa$ | 02+01

$= 4.5 \times 10^4\ Pa$ | 03+01

$K_p = K_c RT$

$K_c = \frac{K_p}{RT}$ | 02

$= \frac{4.5 \times 10^4\ Nm^{-2}}{8.314\ J mol^{-1} K^{-1} \times 300\ K}$ | 02+01

$= 18.04\ mol\ m^{-3}$ | 02+01

$= 1.804 \times 10^{-2}\ mol\ dm^{-3}$

b(ii) – 28

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub
Scanned by TapScanner

(iii) $\frac{P_{He}}{P_T} = \frac{n_{He}}{n_T}$

$\frac{3.5 \times 10^4 Pa}{4.9 \times 10^4 Pa} = \frac{6.5\ mol}{n_T}$ 02+01

$n_T = 9.1\ mol$ 02

$A(g) \rightleftharpoons B(g) + D(g)$

නව සමතුලිත

මවුල $2-y \quad y \quad y$

$\therefore 2-y+y+y+6.5 = 9.1$ 02

$y = 0.6$ 02

$n_A = 1.4 \quad n_B = 0.6 \quad n_D = 0.6$ 01×3

$x_A = \frac{1.4}{9.1} \quad x_B = \frac{0.6}{9.1} \quad x_D = \frac{0.6}{9.1}$ 01×3

$K_p = \frac{x_B \cdot x_D}{x_A} P_T$

$= \frac{\frac{0.6}{9.1} \times \frac{0.6}{9.1}}{\frac{1.4}{9.1}} \times 4.9 \times 10^4 Pa$ 02+01

$= 1.38 \times 10^3 Pa$ 02+01

b(iii) - 21

(iv)

$17°C\ x_B / x_D < 27°C\ x_B / x_D$ 03

හෝ

$K_{p\,17°C} < K_{p\,27°C}$ 03

∴ ඉදිරි ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ.

b(iv) - 06

b - 70

Scanned by TapScanner

06. (a) (i) රසායනික චාලක විද්‍යාවේ සංකල්ප අනුව, $X_2(g) + Y_2(g) \longrightarrow 2XY(g)$ යන ප්‍රතික්‍රියාව සිදුවීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා කවරේ ද?

(ii) දෙන ලද ප්‍රතික්‍රියාවක් සඳහා වේග ප්‍රකාශනයේ යම්කිසි ප්‍රතික්‍රියකයකට අනුරූපව දැක්වෙන පෙළ, සමස්ත තුලිත සමීකරණයෙහි ඇති එම ප්‍රතික්‍රියකයෙහි ස්ටොයිකියොමිතික සංගුණකයට අත්‍යවශ්‍යයෙන්ම සමාන නොවීමට පුළුවන. මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) $4A + B \longrightarrow C$ යන ප්‍රතික්‍රියාවේ දී C සෑදීමේ ශීඝ්‍රතාව මෙසේ ප්‍රකාශ කළ හැකිය.

$$\text{ශීඝ්‍රතාව} = k[A]^x \times [B]^y$$

ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් නියත උෂ්ණත්වයේ දී කරන ලද පරීක්ෂණ ශ්‍රේණියකින් අනාවරණය වූ වැදගත් කරුණු **දෙකක්** පහත දක්වා ඇත.

(I) පරීක්ෂණ දෙකක දී A සාන්ද්‍රණවල අනුපාතය 1 : 1 ද B සාන්ද්‍රණවල අනුපාතය 1 : 2.02 ද වන විට අදාළ ශීඝ්‍රතාවල අනුපාතය 1 : 3.95 විය.

(II) තවත් පරීක්ෂණ දෙකක දී A සාන්ද්‍රණවල අනුපාතය 3 : 1 ද B සාන්ද්‍රණවල අනුපාතය 1 : 4 ද වන විට, අදාළ ශීඝ්‍රතාවල අනුපාතය 1 : 0.59 විය.

මෙ ප්‍රතික්‍රියාව සඳහා x හා y හි අගයන් ගණනය කරන්න.

(a) (i) අණු සට්ටනය විය යුතුය
සම ගැටෙන අණු වල ශක්තිය යම් නිශ්චිත ශක්තියකට වඩා වැඩි විය යුතුය.
අණු නියම දිශානතියකින් ගැටිය යුතුය. 05×3

(ii) • සරල පියවර ප්‍රතික්‍රියාවලදී ප්‍රතික්‍රියක වල ස්ටොයිකියොමිතික සංගුණක වලින් සාන්ද්‍රණය බලයට නැංවීමෙන් ශීඝ්‍රතාවය ප්‍රකාශ කළ හැකිය. 05

• නමුත් බොහෝ රසායනික ප්‍රතික්‍රියා පියවර කිහිපයකින් සමන්විත වේ. එවිට ඒවායේ සාන්ද්‍රණය අනුව සමස්ථ ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව සෙමෙන්ම සිදු වන පියවර මත රඳා පවතී. 05

• මේ අනුව කිසියම් ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව සෑම විටම සමස්ථ ප්‍රතික්‍රියාවේ සංයෝග වල ස්ටොයිකියෝමිතික සංගුණක මත රඳා පවතින්නේ නැත. 05

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned by TapScanner

(iii)

$$R = k[A]^x.[B]^y$$

$$R_1 = k.[A_1]^x.[B_1]^y \quad \text{——— (1)}$$ 03

$$R_2 = k.[A_2]^x.[B_2]^y \quad \text{——— (2)}$$ 03

(1) / (2)

$$\frac{R_1}{R_2} = \left(\frac{[A_1]}{[A_2]}\right)^x . \left(\frac{[B_1]}{[B_2]}\right)^y$$ 03

$$\frac{1}{3.95} = \left(\frac{1}{1}\right)^x . \left(\frac{1}{2.02}\right)^y$$ 06

$$y = 2$$ 03

$$\frac{1}{0.59} = \left(\frac{3}{1}\right)^x . \left(\frac{1}{4}\right)^2$$ 06

$$3^x = \frac{16}{0.59} = 27.1$$ 03

$$x = 3$$ 03

a-60

(b) බෙන්සීන් මවුල 2 ක් සහ ටොලුයීන් මවුල 3 ක් ඇති ද්‍රාවණයක සමස්ත වාෂ්ප පීඩනය එක්තරා උෂ්ණත්වයක දී 280 mm Hg වේ. මෙම ද්‍රාවණයට තවත් බෙන්සීන් මවුල 1 ක් එකතු කළ විට ලැබෙන X නමැති නව ද්‍රාවණයේ සමස්ත වාෂ්ප පීඩනය එම උෂ්ණත්වයේ දී ම 300 mm Hg වේ. මේ උෂ්ණත්වයේ දී X ද්‍රාවණය සමග සමතුලිත ව පවතින වාෂ්පයෙහි ඇති බෙන්සීන් මවුල භාගය ගණනය කරන්න.

සැ.යු. බෙන්සීන් සහ ටොලුයීන් පරිපූර්ණ ද්‍රාවණ සාදන බව උපකල්පනය කරන්න.

බෙන්සීන්හි සංතෘප්ත වාෂ්ප පීඩනය $P^o_B$

ටොලුයීන්හි සංතෘප්ත වාෂ්ප පීඩනය $P^o_T$

ආරම්භක ද්‍රාවණයේ $x_B = \frac{2}{5}$ 02

$$x_T = \frac{3}{5}$$ 02

Scanned by TapScanner

මුළු පීඩනය = $P_B + P_T$

$280\ mmHg = P^o_B \times \frac{2}{5} + P^o_T \times \frac{3}{5}$ —(1) 03

නව ද්‍රාවණයේ $x_B = \frac{1}{2}$ 02

$x_T = \frac{1}{2}$ 02

$300\ mmHg = P^o_B \times \frac{1}{2} + P^o_T \times \frac{1}{2}$ —(2) 03

(1) හා (2) සමීකරණ විසඳීමෙන්

$P^o_B = 400\ mmHg$ 03

$P^o_T = 200\ mmHg$ 03

නව ද්‍රාවණයේ

$P_B = 400 \times \frac{1}{2} = 200\ mmHg$ 02

$P_T = 200 \times \frac{1}{2} = 100\ mmHg$ 02

වාෂ්ප කලාපයේ බෙන්සීන් මවුල භාගය = $\frac{P_B}{P_{මුළු පීඩනය}}$ 02

$= \frac{200}{300}$ 02

$= 2/3 = 0.67$ 02

b - 30

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned by TapScanner

(c) 25 °C දී පිළියෙල කරන ලද පහත දී ඇති P, Q, R සහ S ද්‍රාවණ සලකන්න.

P: 0.056 mol $dm^{-3}$ $CH_3COOH$ හි 100.0 $cm^3$

Q: 0.056 mol $dm^{-3}$ $CH_3COOH$ හි 50.0 $cm^3$ ක සහ 0.200 mol $dm^{-3}$HCl හි 50.0 $cm^3$ ක මිශ්‍රණය

R: 0.020 mol $dm^{-3}$ HCl හි 50.0 $cm^3$ ක සහ 0.022 mol $dm^{-3}$NaOH හි 50.0 $cm^3$ ක මිශ්‍රණය

S: 0.056 mol $dm^{-3}$ NaOH හි 100.0 $cm^3$

25 °C දී $CH_3COOH$ හි විඝටන නියතය $K_a$ සහ ජලයෙහි අයනික ගුණිතය, $K_W$ පිළිවෙළින් $1.8 \times 10^{-5}$ mol $dm^{-3}$ සහ $1.0 \times 10^{-14}$ $mol^2$ $dm^{-6}$ වේ.

(i) P ද්‍රාවණයෙහි, Q ද්‍රාවණයෙහි සහ R ද්‍රාවණයෙහි pH ගණනය කරන්න.

(ii) එක් එක් ගණනය කිරීමේ දී ඔබ භාවිත කළ යම් උපකල්පන වෙතොත්, ඒවා සඳහන් කරන්න.

(iii) P, Q, R සහ S යන ද්‍රාවණවලින් දෙකක් භාවිත කර, ස්වාරක්ෂක ද්‍රාවණයක් සෑදිය හැකි ආකාරය දක්වන්න.

(i) P ද්‍රාවණය

$$CH_3COOH_{(aq)} + H_2O_{(l)} \rightleftharpoons CH_3COO^-_{(aq)} + H_3O^+_{(aq)}$$ 03

ආ. සාන්ද්‍රණ mol$dm^{-3}$ 0.056

සමතුලිත සාන්ද්‍රණ mol$dm^{-3}$ 0.056 − $x$ $x$ $x$ 02+01

$$K_a = \frac{[CH_3COO^-_{(aq)}][H_3O^+_{(aq)}]}{[CH_3COOH_{(aq)}]}$$ 03

$$1.8 \times 10^{-5} mol dm^{-3} = \frac{x^2}{0.056 mol dm^{-3} - x}$$ 03

$x <<<< 0.056$ $\therefore 0.056 - x \simeq 0.056$

$\therefore x^2 = 1.8 \times 0.056 \times 10^{-5} mol^2 dm^{-6}$ 03

$x = 1 \times 10^{-3}$ mol$dm^{-3}$ 03

$$pH = -\log[H^+_{(aq)}]$$
$$= -\log 10^{-3}$$
$$= 3$$ 03

Scanned by TapScanner

Q ද්‍රාවණය

$0.056\, mol\, dm^{-3}$ $CH_3COOH_{(aq)} \rightleftharpoons CH_3COO^-_{(aq)} + H^+_{(aq)}$

$0.2\, mol\, dm^{-3}$ $HCl_{(aq)} \rightarrow H^+_{(aq)} + Cl^-_{(aq)}$

$$[H^+_{(aq)}] = \frac{0.2 \times 50 \times 10^{-3}\, mol}{100 \times 10^{-3}\, dm^3}$$ 03

$$= 0.1\, mol\, dm^{-3}$$ 02+01

$$pH = -\log(10^{-1}) = 1$$ 03

R ද්‍රාවණය

$HCl_{(aq)} + NaOH_{(aq)} \rightarrow NaCl_{(aq)} + H_2O_{(l)}$

යෙදූ mol $\frac{0.02 \times 50}{1000}$ $\frac{0.022 \times 50}{1000}$

ඉතිරි mol — $\frac{0.002 \times 50}{1000}$

$\therefore$ ඉතිරි $[OH^-_{(aq)}] = \frac{0.002 \times 50 \times 10^{-3}\, mol}{100 \times 10^{-3}\, dm^3}$ 03

$$= 0.001\, mol\, dm^{-3}$$ 02+01

$$pOH = -\log(10^{-3}) = 3$$ 03

$$pH = 14 - 3 = 11$$ 03

(i) - 42

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
Scanned by TapScanner

(ii) උපකල්පන

P ද්‍රාවණය : $CH_3COOH$ හි අයනීකරණය වන ප්‍රමාණය ආරම්භක සාන්ද්‍රණය සමග සැසඳීමේදී නොසලකා හැරී. 03

Q ද්‍රාවණය : HCl වලින් ලැබෙන $[H^+]$ සමග සසඳන විට $CH_3COOH$ අයනීකරණයෙන් ලැබෙන $[H^+]$ නොසලකා හැරී. 03

R ද්‍රාවණය : මුළු $[H^+]$ ට $H_2O$ අයනීකරණයෙන් ලැබෙන $[H^+]$ නොසලකා හැරී 03

ii - 09

(iii)

P සහ S ද්‍රාවණ භාවිතා කරන්න. 03

P වැඩි පරිමාවක් S අඩු පරිමාවක් සමග 03
මිශ්‍ර කරන්න.
මෙවිට ද්‍රාවණයේ $CH_3COOH$ හා $CH_3COONa$
මිශ්‍රණයක් ඇති නිසා ද්‍රාවණය ස්වාරක්ෂක වේ. 03

iii - 09

c - 60

Scanned by TapScanner

07. (a)(i) I. සිල්වර් - සිල්වර් ක්ලෝරයිඩ් ඉලෙක්ට්‍රෝඩයේ රූප සටහනක් ඇඳ එහි ඇති සියලු වැදගත් කොටස් නම් කරන්න.

II. ඉලෙක්ට්‍රෝඩ සමතුලිත ප්‍රතික්‍රියාව ලියන්න.

III. මෙම ඉලෙක්ට්‍රෝඩයේ ඉලෙක්ට්‍රෝඩ විභවය රඳා පවතින කරුණු දෙකක් සඳහන් කරන්න.

IV. සිල්වර් - සිල්වර් ක්ලෝරයිඩ් ඉලෙක්ට්‍රෝඩයේ ප්‍රායෝගික භාවිතය සඳහා එක් උදාහරණයක් දෙන්න.

V. ප්‍රායෝගිකව සංසන්දනාත්මක ඉලෙක්ට්‍රෝඩය ලෙස සම්මත හයිඩ්‍රජන් ඉලෙක්ට්‍රෝඩයට වඩා මෙය භාවිත කිරීමේ යෝග්‍යතාව පැහැදිලි කරන්න. (කරුණු දෙකක්)

(ii) I. මැග්නීසියම් ඉලෙක්ට්‍රෝඩ යොදා ජලීය සෝඩියම් සල්ෆේට් ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනය කරනු ලැබේ. මෙහි දී සිදු වන ඇනෝඩ ප්‍රතික්‍රියාව, කැතෝඩ ප්‍රතික්‍රියාව සහ සමස්ත ප්‍රතික්‍රියාව ලියන්න.

II. ජලීය සෝඩියම් සල්ෆේට් ද්‍රාවණයකින් $250\ cm^3$ ක් මැග්නීසියම් ඉලෙක්ට්‍රෝඩ යොදා 50 mA ක ධාරාවක් යටතේ විද්‍යුත් විච්ඡේදනය කරනු ලැබේ. ද්‍රාවණයේ යන්තමින් ආවිලතාවක් ඇතිවීම සඳහා ගත වන කාලය ගණනය කරන්න.

($1\ F = 96500\ C$, $Mg(OH)_2$ හි ද්‍රාව්‍යතා ගුණිතය $= 4.0 \times 10^{-12}\ mol^3dm^{-9}$)

III. ඉහත ගණනය කිරීම්වල දී ඔබ යොදාගත් උපකල්පනයක් සඳහන් කරන්න.

---

(i) I.




01×4

04

II. $AgCl_{(s)} + e \rightleftharpoons Ag_{(s)} + Cl^-_{(aq)}$

III. $Cl^-_{(aq)}$ අයන සාන්ද්‍රණය

උෂ්ණත්වය

03×2

05

IV. වෙනත් ඉලෙක්ට්‍රෝඩයක $E_{cell}$ මැනීම සඳහා සංසන්දනාත්මක ඉලෙක්ට්‍රෝඩය ලෙස යොදා ගැනීම.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
Scanned by TapScanner

V. • සැකසීම පහසුය
• භාවිතය පහසුය
• බොහෝ විට ලවණ සේතුවක් අවශ්‍ය නොවේ
• පීඩනය පාලනය අවශ්‍ය නොවේ
• වියදම අඩුය
• මෙහි විභවය පරික්ෂණය අතරතුරදී බොහෝ
දුරට නියතව පවතී. 03×2

(i) - 25

(ii) I. ඇනෝඩ ප්‍රතික්‍රියාව

$$Mg_{(s)} \rightarrow Mg^{2+}_{(aq)} + 2e$$

කැතෝඩ ප්‍රතික්‍රියාව

$$2H_2O_{(l)} + 2e \rightarrow H_{2(g)} + 2OH^-_{(aq)}$$

සමස්ත ප්‍රතික්‍රියාව

$$Mg_{(s)} + 2H_2O_{(l)} \rightarrow Mg^{2+}_{(aq)} + H_{2(g)} + 2OH^-_{(aq)}$$

05×3

II. $Mg(OH)_{2(s)} \rightleftharpoons Mg^{2+}_{(aq)} + 2OH^-_{(aq)}$ 03

විද්‍යුත් විච්ඡේදනයේදී $Mg^{2+} : OH^-$, 1:2 අනුපාතයෙන් සෑදේ. 03

අවක්ෂේප ඇතිවන අවස්ථාවේදී ද්‍රාවණය $Mg(OH)_2$ වලින් සංතෘප්තයි.
එවිට $[Mg^{2+}_{(aq)}] = x$ ලෙස ගනිමු.

$$K_{sp} = [Mg^{2+}_{(aq)}][OH^-_{(aq)}]^2$$ 03

$$4\times10^{-12}\,mol^3dm^{-9} = x.(2x)^2 = 4x^2$$ 03

$$x = 1\times10^{-4}\,mol\,dm^{-3}$$ 03

ද්‍රාවණ 250 $cm^3$ තුළ ඇති $Mg^{2+}$ මවුල ගණන $= 2.5\times10^{-5}\,mol$ 03

$Mg^{2+}$ $2.5\times10^{-5}$ mol සෑදීමට අවශ්‍ය
විද්‍යුත් ප්‍රමාණය $= 96500\times2\times2.5\times10^{-5}\,C$
$= 965\times5\times10^{-3}\,C$

03

Scanned by TapScanner

$Q = it$ 

$t = \frac{Q}{i}$ | 03

$= \frac{965 \times 5 \times 10^{-3} C}{50 \times 10^{-3} A}$ | 03

$= 96.5 s$ | 03

III. විද්‍යුත් විච්ඡේදනයේදී වෙනත් කිසිදු ප්‍රතික්‍රියාවක් සිදු නොවන බව | 05

(ii) - 50

a - 75

(b) 3d ගොනුවේ මූලද්‍රව්‍යයක් වන M, සූත්‍රය $2MXO_3 . M(OH)_2$ වන A සංයෝගය සාදයි. මෙහි X මූලද්‍රව්‍යය, p ගොනුවට අයත් වේ. A සංයෝගය සාන්ද්‍ර HCl සමග ප්‍රතික්‍රියා කර අවර්ණ, ගන්ධයක් නොමැති B වායුව හා කහ පැහැති C ද්‍රාවණය ලබා දෙයි. A, තනුක HCl සමග ප්‍රතික්‍රියා කළ විට අවර්ණ හා ගන්ධයක් නොමැති එම B වායුව හා M හි, සංකීර්ණ අයන දෙකක් අඩංගු කොළ පැහැති D ද්‍රාවණය ලබා දෙයි. D ද්‍රාවණය ජලය සමග තනුක කළ විට ලා නිල් පැහැති E ද්‍රාවණය ලබා දෙයි. $NH_4OH$ සුළු ප්‍රමාණයක් E ට එකතු කළ විට නිල් පැහැති ජෙලටිනීය F අවක්ෂේපය සෑදෙයි. වැඩිපුර $NH_4OH$ වල F ද්‍රාවණය වී, තද නිල් පැහැති G ද්‍රාවණය සාදයි. වැඩිපුර KI සමග E ද්‍රාවණය මිශ්‍රකළ විට, ඵල ලෙස MI අවක්ෂේපය සහ අයඩීන් පමණක් සෑදේ.

(i) M සහ X යන මූලද්‍රව්‍ය හඳුනාගන්න.

(ii) M හි ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය දෙන්න.

(iii) M හි බහුලව පවතින ඔක්සිකරණ අංක දක්වන්න.

(iv) පහත සඳහන් ද්‍රාවණවල වර්ණ සඳහා හේතුවන අයනික විශේෂවල සූත්‍ර ලියා, ඒවායේ IUPAC නාම දෙන්න.

I. C ද්‍රාවණය

II. D ද්‍රාවණය

III. E ද්‍රාවණය

IV. G ද්‍රාවණය

(v) B වායුව සහ F අවක්ෂේපය හඳුනාගන්න.

(vi) E ද්‍රාවණය වැඩිපුර KI සමග දක්වන ප්‍රතික්‍රියාව සඳහා වන තුලිත රසායනික සමීකරණය දෙන්න.

(vii) උණු සාන්ද්‍ර $HNO_3$ සමග වෙන් වෙන් ව M සහ X දක්වන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

(vii) පහසුවෙන් ඔක්සිකරණය වන සමහර සංයෝග සමග භාස්මික තත්ත්ව යටතේ M හි සාමාන්‍යයෙන් පවතින ලවණ රත් කළ විට, $M_2O$ අවක්ෂේප වේ. මෙම ක්‍රියාවලිය සඳහා තුලිත **අර්ධ ප්‍රතික්‍රියාව** ලියා, එම ප්‍රතික්‍රියාවෙහි එක් වැදගත් ප්‍රයෝජනයක් දක්වන්න.

(viii) M හි වැදගත් වාණිජමය භාවිත දෙකක් දක්වන්න.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned by TapScanner

| Answer | Marks |
|---|---|
| (i) M - Cu     X - C | 05×2 |
| (ii) $1s^2 2s^2 2p^6 3s^2 3p^6 3d^{10} 4s^1 / 4s^1 3d^{10}$ | 04 |
| (iii) +1 , +2 | 02×2 |
| (iv) I. C - $[CuCl_4]^{2-}$ <br> tetrachloridocuprate(II) ion <br> II. D - $[Cu(H_2O)_6]^{2+}$ <br> hexaaquacopper(II) ion <br> $[CuCl_4]^{2-}$ or $[CuCl(H_2O)_5]^+$ <br> III. E - $[Cu(H_2O)_6]^{2+}$ <br> IV. G - $[Cu(NH_3)_4]^{2+}$ <br> tetraamminecopper(II) ion | 03×8 |
| (v) B - $CO_2$     F - $Cu(OH)_2$ | 04×2 |
| (vi) $2Cu^{2+} + 4I^- \longrightarrow 2CuI + I_2$ | 04 |
| (vii) $Cu + 4HNO_3 \rightarrow Cu(NO_3)_2 + 2NO_2 + 2H_2O$ <br> $C + 4HNO_3 \rightarrow CO_2 + 4NO_2 + 2H_2O$ | 04×2 |
| (viii) $2Cu^{2+} + 2e + 2OH^- \longrightarrow Cu_2O + H_2O$ | 04 |
| ඇල්ඩිහයිඩ හඳුනා ගැනීමේදී / <br> ඔක්සිහාරක සීනි හඳුනා ගැනීමේදී | 03 |
| (ix) විද්‍යුත් සන්නායක <br> මිශ්‍ර ලෝහ සෑදීම (හෝ වෙනත් නිවැරදි කරුණු සඳහා) | 03×2 |
| | b-75 |

Scanned by TapScanner

**C කොටස - රචනා**

**ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් ලැබේ.)**

08. (a) ෆීනෝල් ($C_6H_5OH$) සහ එතනෝල් ($C_2H_5OH$) යන සංයෝග දෙක අතරින් වඩා ආම්ලික වන්නේ කුමක් දැයි හේතු දක්වමින් සඳහන් කරන්න.

$C_2H_5OH + H_2O \rightleftharpoons C_2H_5O^- + H_3O^+$ 02

$C_6H_5OH + H_2O \rightleftharpoons C_6H_5O^- + H_3O^+$ 02

- ඉහත සමතුලිතතා අතරින් ෆීනෝල් හි සමතුලිතතා ලක්ෂය, එතනෝල් හි සමතුලිතතා ලක්ෂයට වඩා ඉදිරියට නැඹුරුය. 02
- මෙයට හේතුව, ෆීනෝල් වලට සාපේක්ෂව ෆීනේට් අයනයේ ස්ථායිතාව ඇල්කොහොල් වලට සාපේක්ෂව ඇල්කොක්සයිඩ් අයනයේ ස්ථායිතාවට වඩා වැඩි වීමයි. 02
- ෆීනේට් අයනයේ ඇති සෘණ ආරෝපණය සම්ප්‍රයුක්තතාව මගින් විස්ථානගත වන බැවින් වඩාත් ස්ථායී වේ. 02
- සම්ප්‍රයුක්ත ව්‍යුහ ඇඳීම සඳහා 02
- ඇල්කොක්සයිඩ් අයනයේ සෘණ ආරෝපණ විස්ථානගත වීමක් නැත / සම්ප්‍රයුක්ත ව්‍යුහ නැත. 02
- ෆීනෝල් එතනෝල් වලට වඩා ආම්ලික වේ. 02

a-16

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
Scanned by TapScanner

(b) පහත ඉදිරිපත් කර ඇති පරිවර්තන සිදුකල හැකි ආකාරය දක්වන්න. අවශ්‍ය ප්‍රතිකාරක හා ප්‍රතික්‍රියා තත්ත්ව උචිත ස්ථාන වල පැහැදිලි ව සඳහන් කළ යුතුය.

සැ.යු. ඔබගේ යෝජිත පරිවර්තන ක්‍රමය අනවශ්‍ය ලෙස දීර්ඝ වන්නේ නම් ඔබට උපරිම ලකුණු නොලැබේ.

(i)




(ii)




(iii) $(CH_3)_2CHOH \longrightarrow CH_3-\underset{\displaystyle CH_3}{\underset{|}{C}}=CHCH_2CH_3$

(iv)




(ලකුණු 9.8)

(i)




03 × 5

b(i) - 15

(ii)




04 × 5

b(ii) - 20

(iii)




04 × 7

b(iii) - 28

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
Scanned by TapScanner

(iv)




05×7

b(iv)-35

b-98

(c) ලැයිස්තුවෙහි දී ඇති රසායනික ද්‍රව්‍ය සහ ප්‍රතිකාරක පමණක් උපයෝගී කරගනිමින්, පහත දැක්වෙන සංයෝගයේ සංශ්ලේෂණයක් යෝජනා කරන්න.

$$CH_3-\overset{\overset{\large O}{\|}}{C}-O-\overset{\overset{\large CH_3}{|}}{CH}-CH_2CH_3$$

| |
|---|
| රසායන ද්‍රව්‍ය සහ ප්‍රතිකාරක ලැයිස්තුව: |
| $CH_3CHO$, $PBr_3$, $Mg$, ඊතර්, තනුක $H_2SO_4$, |
| $NaBH_4$, $K_2Cr_2O_7$ සාන්ද්‍ර $H_2SO_4$ |

$CH_3CHO$ (02) $\xrightarrow{NaBH_4\ (02)}$ $CH_3CH_2OH$ (02) $\xrightarrow{PBr_3\ (02)}$ $CH_3CH_2Br$ (02) $\xrightarrow{Mg\ \text{වියළි ඊතර්}\ (02)}$ $CH_3CH_2MgBr$ (02)

Scanned by TapScanner

$$CH_3CHO \xrightarrow[\text{(ii) dil. } H_2SO_4 \ (01)]{\text{(i) } CH_3CH_2MgBr \ (01)} CH_3CH(OH)CH_2CH_3$$

(02) (02)

$$CH_3CHO \xrightarrow[\text{dil. } H_2SO_4 \ (01)]{K_2Cr_2O_7 \ (01)} CH_3COOH$$

(02) (02)

$$CH_3COOH + CH_3CH(OH)CH_2CH_3 \xrightarrow[(02)]{\text{conc. } H_2SO_4} CH_3-C(=O)-OCH(CH_2CH_3)CH_3$$

(04) (04)

C-36

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
Scanned by TapScanner

09. (a) පහත සඳහන් ප්‍රශ්නය ආවර්තිතා වගුවේ s සහ p ගොනුවල මූලද්‍රව්‍ය මත පදනම් වී ඇත. පහත දී ඇති ප්‍රතික්‍රියා සැලැස්මේ **P, Q, R, S, T, U, V, W, X** හා **Y** රසායනික විශේෂ හඳුනා ගන්න.

**P** (සුදු ඝනය) $\xrightarrow{\Delta}$ **Q** (සුදු ඝනය) +**R** (අවර්ණ වායුව)

**Q** $\xrightarrow{\text{තනුක HCl}}$ **S** (රතු දුඹුරු වායුව) + අනෙකුත් ඵල

**Q** + $NH_4Cl(s)$ $\xrightarrow{\Delta}$ **T** (පහන් සිළු පරීක්ෂාවේ දී දීප්තිමත් කහ පැහැයක් ලබා දෙන සුදු පැහැති අවශේෂය) + **U** (අවර්ණ වායුව) + ජල වාෂ්ප

**R** + **V** (අවර්ණ වායුව) $\xrightarrow[\text{උෂ්ණත්වය}]{\text{ඉහළ}}$ **U** + ජලවාෂ්ප

$Ca(s)$ + **U** $\xrightarrow{\Delta}$ **W** (සුදු ඝනය)

**W** + $H_2O(l)$ $\longrightarrow$ **V** + තවත් ඵලයක්

$Mg(s)$ + **R** $\xrightarrow{\Delta}$ **X** (සුදු ඝනය)

**X** + $H_2O(l)$ $\longrightarrow$ **Y** (පිනොල්ප්තලීන් රෝස පැහැ ගන්වයි)

(a) P - $NaNO_3$ U - $N_2$
Q - $NaNO_2$ V - $NH_3$
R - $O_2$ W - $Ca_3N_2$
S - $NO_2$ X - $MgO$
T - $NaCl$ Y - $Mg(OH)_2$

05×10
a-50

(b) එකිනෙක හා මිශ්‍ර කිරීමෙන්, පහත සඳහන් තනුක ජලීය ද්‍රාවණ ඔබ හඳුනාගන්නේ කෙසේ දැයි කෙටියෙන් දක්වන්න.

KI, $Fe_2(SO_4)_3$, $BaCl_2$, $K_4Fe(CN)_6$

(b) • ද්‍රාවණ දෙක බැගින් මිශ්‍ර කරන විට දුඹුරු පැහැයක් ලැබෙනුයේ KI සහ $Fe_2(SO_4)_3$ මගිනි. 10

• මෙම ද්‍රාවණ වෙන වෙනම අනිත් ද්‍රාවණ දෙකට එක් කරන විට සුදු අවක්ෂේපයක් ලැබෙනුයේ $BaCl_2$ සහ $Fe_2(SO_4)_3$ මගිනි. 20

• ඉතිරි වූ ද්‍රාවණය $K_4[Fe(CN)_6]$ වේ. 10

b-40

(වෙනත් නිවැරදි ක්‍රම සඳහා ලකුණු දෙන්න).

Scanned by TapScanner

(c) මලකඩ බැඳුනු (විබාදනය වූ)පෘෂ්ඨයක් ඇති සම්පූර්ණ ස්කන්ධය 0.30 g වන යකඩ ඇණයක්, 0.2 mol $dm^{-3}$ $H_2SO_4$ 50.0 $cm^3$ක සම්පූර්ණයෙන් ද්‍රාවණය කරන ලදී. එසේ ලැබූ ද්‍රාවණය සමග සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීම සඳහා 0.02 mol $dm^{-3}$ $KMnO_4$ 25.0 $cm^3$ ක් අවශ්‍ය විය. මලකඩ සම්පූර්ණයෙන් ම ෆෙරික් ඔක්සයිඩ්, $Fe_2O_3$ ලෙස උපකල්පනය කළ හැක.

(i) මලකඩ බැඳුනු යකඩ ඇණය, $H_2SO_4$ හි ද්‍රවණය සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(ii) Fe(II) හා $KMnO_4$ අතර ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(iii) විබාදනය වීමට ප්‍රථම, යකඩ ඇණයේ ස්කන්ධය ගණනය කරන්න.

(සාපේක්ෂ පරමාණුක ස්කන්ධ : O = 16, Fe = 56)

(i) $Fe + H_2SO_4 \rightarrow FeSO_4 + H_2$ 05

$Fe_2O_3 + 3H_2SO_4 \rightarrow Fe_2(SO_4)_3 + 3H_2O$ 10

(ii) $5Fe^{2+} + MnO_4^- + 8H^+ \rightarrow 5Fe^{3+} + Mn^{2+} + 4H_2O$ 10

(හෝ වෙනත් නිවැරදි සමීකරණයකට)

(iii) $KMnO_4$ මවුල ගණන $= 0.02 \times 25 \times 10^{-3}$ mol 04

∴ $Fe^{2+}$ මවුල ගණන $= 5 \times 0.02 \times 25 \times 10^{-3}$ mol

$= 2.5 \times 10^{-3}$ mol 04

∴ විබාදනය වූ ඇණයේ 0.3 g තුළ පැවති සංශුද්ධ Fe මවුල ගණන $= 2.5 \times 10^{-3}$

ස්කන්ධය $= 2.5 \times 10^{-3} \times 56$

$= 0.14$ g 04

∴ 0.3 g තුළ ඇති $Fe_2O_3$ ස්කන්ධය $= 0.3\text{ g} - 0.14\text{ g}$

$= 0.16$ g 04

$Fe_2O_3$ මවුල ගණන $= \frac{0.16}{160}$ mol

∴ එහි ඇති $Fe^{3+}$ ප්‍රමාණය $= \frac{0.16}{160} \times 2$ mol 04

∴ Fe ස්කන්ධය $= \frac{0.16 \times 2 \times 56}{160}$ g

$= 0.112$ g 05

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
Scanned by TapScanner

∴ විඝාදනය වීමට පෙර යකඩ ඇණයේ ස්කන්ධය = 0.14g + 0.112g = 0.252g | 05 | 05

c - 60

10. (a) $N_2$ සහ $H_2$ භාවිත කරමින් $NH_3$ කාර්මිකව නිෂ්පාදනය කෙරේ. පහත ප්‍රශ්න $NH_3$ නිෂ්පාදනය සඳහා වන හේබර් ක්‍රමය හා බැඳේ.

(i) මෙම ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා $N_2$ සහ $H_2$ වල ප්‍රභව මොනවා ද?

(ii) භාවිත කෙරෙන විශේෂිත ප්‍රතික්‍රියා තත්ත්ව මොනවා ද? (උෂ්ණත්වය, පීඩනය සහ උත්ප්‍රේරක)

(iii) ඉදිරි ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව, ආපසු ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව සහ සමතුලිතතා නියතය යන මේවා කෙරෙහි උත්ප්‍රේරකය බලපාන්නේ කෙසේ ද?

(iv) $NH_3$ ඔක්සිකරණයට භාජනය කරන එක් කර්මාන්තයක් නම් කරන්න. මෙම ඔක්සිකරණයේ දී යොදා ගන්නා ප්‍රතික්‍රියා තත්ත්ව මොනවා ද?

(v) $NH_3$ වල එක් ගෘහස්ත ප්‍රයෝජනයක් දෙන්න.

(i) $N_2$ - වායුගෝලීය වාතය | 04

$H_2$ - පෙට්‍රෝලියම් බිඳීමෙන් / හයිඩ්‍රොකාබන බිඳීමෙන් / $CH_4$ බිඳීම මගින් | 04

(ii) උෂ්ණත්වය - 450 - 500°c

පීඩනය - 250 - 300 atm

උත්ප්‍රේරක - Fe හෝ යකඩ ඔක්සයිඩ | 04×3

(iii) ඉදිරි ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව වැඩි කරයි

පසු ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව වැඩි කරයි

සමතුලිතතා නියතයට බලපෑමක් නැත | 04×3

(iv) ඔස්වල්ඩ් ක්‍රමය ($HNO_3$ නිෂ්පාදනය)

උෂ්ණත්වය - 800 - 850°c

පීඩනය - 1 - 4 atm

උත්ප්‍රේරක - Pt / Rh මිශ්‍රණය | 04×4

(v) පිරිසිදු කාරක ලෙස (harpic ආදියේ අඩංගු වේ). | 02

a - 50

(b) (i) I. ජලයේ තාවකාලික කඨිනත්වය යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?

II. තාවකාලික කඨිනත්වයට හේතුවන රසායනික විශේෂ මොනවා ද?

III. තාවකාලික කඨිනත්වය නිසා ඇතිවන ගෘහස්ථ ගැටලු දෙකක් දෙන්න.

IV. තාවකාලික කඨිනත්වය ඉවත් කළ හැකි ක්‍රම දෙකක් දෙන්න.

(ii) පහත දී ඇති සංයෝග සලකන්න.

$CH_3(CH_2)_4CH_3$ $CFCl_3$ $CF_2Cl_2$ $N_2$ $NO$

මේවා අතුරෙන්,

I. ගෝලීය උණුසුම්කරණය
II. ඕසෝන් ස්තරය ක්ෂයවීම

සඳහා දායකවන සංයෝග හඳුනා ගන්න.

(iii) ඕසෝන් ස්තරයෙහි ඕසෝන් සෑදීමත් විනාශවීමත් ස්වභාවිකව සිදුවේ. ඕසෝන් ස්තර කලාපයට මුක්ත ඛණ්ඩක සාදන සංයෝග ඇතුළුවීමෙන් ද උත්ප්‍රේරිතව ඕසෝන් හානි වේ. ඕසෝන් ස්තරයෙහි පහත දැක්වෙන ක්‍රියාවලි සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

I. ස්වභාවිකව ඕසෝන් සෑදීම සහ විනාශ වීම.
II. ඛණ්ඩක සෑදීම.
III. ඕසෝන්වල උත්ප්‍රේරිත විනාශ වීම.

(i) I. ජලය තැම්බීම මගින් ඉවත් කළ හැකි කඨිනත්වය — 03

II. $Ca^{2+}$ සහ $Mg^{2+}$ අයනවල $HCO_3^-$ — 03

III. • වැඩිපුර සබන් දිය වී යාම / සබන් වල ශෝධන ක්‍රියාවලියට බාධා ඇතිවීම
• ජලයට කිවුල් රසක් / අප්‍රසන්න රසයක් ඇතිවීම.
• ජලය තැම්බීමේදී භාජන පතුලේ අවක්ෂේප සෑදීම
(තරම් 2 ක්) — 03×2

IV. රත් කිරීම / $Na_2CO_3$ එකතු කිරීම
අයන හුවමාරු රෙසින තුළින් යැවීම — 03×2

b(i)–18

PAST PAPERS WIKI
iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned by TapScanner

(ii) I. $CH_3(CH_2)_4CH_3$ , $CFCl_3$ , $CF_2Cl_2$ , $NO$ | 02×7

II. $CFCl_3$ , $CF_2Cl_2$ , $NO$

(ii) I.
$$O_2(g) \xrightarrow{h\nu} 2O(g)$$
$$O(g) + O_2(g) \longrightarrow O_3(g)$$
} $O_3$ සෑදීම
$$O_3(g) \xrightarrow{h\nu} O(g) + O_2(g)$$
$$O(g) + O_3(g) \longrightarrow 2O_2(g)$$

II. $$CCl_3F \xrightarrow{h\nu} {}^\bullet Cl + {}^\bullet CCl_2F$$

III. $${}^\bullet Cl + O_3 \longrightarrow {}^\bullet OCl + O_2$$
$$O_3(g) \longrightarrow O_2(g) + {}^\bullet O(g)$$
$${}^\bullet OCl + {}^\bullet O \longrightarrow O_2(g) + {}^\bullet Cl(g)$$
$$2O_3(g) \xrightarrow[\text{උත්ප්‍රේරක}]{{}^\bullet Cl} 3O_2(g)$$

02×9

b−50

(c) බහුඅවයවක කර්මාන්තයට අදාළ රසායනික සංයෝග කිහිපයක් පහත දැක්වේ.

HCHO | $HOCH_2CH_2OH$ | $CF_2 = CF_2$ |  | $C_6H_5OH$ | $CH_2 = C(CH_3) - CH = CH_2$



මෙම සංයෝග එකක් හෝ වැඩි ගණනක් හෝ යොදා නිෂ්පාදනය කරන බහුඅවයවක පමණක් සලකා පහත දැක්වෙන ප්‍රශ්නවලට උත්තර සපයන්න.

(i) සුලබ ව භාවිත වන බහුඅවයවක හතරක නම් සඳහන් කරන්න.
(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ එක් එක් බහුඅවයවකයෙහි ප්‍රයෝජනයක් බැගින් සඳහන් කරන්න.
(iii) තාපයට වඩාත් ම ඔරොත්තු දෙන බහුඅවයවකයෙහි පුනරාවර්ත ඒකකයක (repeat unit) ව්‍යුහය අඳින්න.
(iv) ඉහළ ම ප්‍රත්‍යස්ථතාව ඇති බහුඅවයවකයෙහි පුනරාවර්ත ඒකකයක ව්‍යුහය අඳින්න.
(v) තාපස්ථාපන(thermosetting) බහුඅවයවකයක් සඳහා එක් උදාහරණයක් දෙන්න.

Scanned by TapScanner

(i) I. බේක්ලයිට්

II. පොලිතීන්

III. ටෙෆ්ලෝන්

IV. ස්වාභාවික රබර් (නම් සඳහා පමණක් ලකුණු ලබා දෙන්න) — 04×4

(ii) I. තාප පරිවාරක / විද්‍යුත් පරිවාරක

II. රෙදිපිළි

III. නොඇලෙන සුළු බඳුන්හි ආලේපනය / ගිනි නිවන ඇඳුම්

IV. ටයර් සහ ටියුබ්. — 04×4

(iii) $-CF_2-CF_2-$ — 06

(iv) $-CH_2-C(H)=C(CH_3)-CH_2-$ — 06

(v) බේක්ලයිට් — 06

C-50